**පාසල් අධ්‍යාපන ක්‍රමය දැනුමේ කේන්ද්‍රීය පදනම ලෙස පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතියේ (ටීඑස්ඊපී) - පළාත් මට්ටම - 2017**

---

පාසල් අධ්‍යාපන ක්‍රමය දැනුමේ කේන්ද්‍රීය පදනම ලෙස පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2012 මැයි 18 දින එළඹි අංක 5037 - එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ උපලේඛන 2 හි II (ආ) (3) වගන්තිය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ඕස්ට්‍රේලියානු භාර අරමුදල අතර 2013 ජූලි 18 දින එළඹි අංක ටීඑෆ් 013267 දරන ඕස්ට්‍රේලියානු ප්‍රදාන ගිවිසුමේ II (ආ) (3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මූල්‍ය සහ ප්‍රදාන ගිවිසුම්වලට අනුව, අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ව්‍යාපෘතියේ කටයුතු ජාතික මට්ටමින් සිදුකිරීමට හා එවකට පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය, වර්තමානයේ පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යාංශය සහ සියළුම පළාත්සභාවල පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ පළාත් මට්ටමේ කටයුතු සිදුකිරීමට අපේක්ෂා කෙරේ. පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යාංශය සහ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පළාත් මට්ටමින් සිදුකළ කාර්යයන් පිළිබඳ මාගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුමට අනුව, රටේ සාමාන්‍ය අධ්‍යාපන ක්ෂේත්‍රය මුහුණ දෙන අභියෝග සඳහා යොමුවීමට 2012-2016 අධ්‍යාපන ක්ෂේත්‍ර සංවර්ධන කාර්යය රාමුවක් සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට මූල්‍ය සහයෝගය ලබාදීම සඳහා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ. ව්‍යාපෘතියේ අරමුණු වනුයේ, ශ්‍රී ලංකාවේ දැනුම පදනම් වූ ආර්ථිකය සහ සමාජ සංවර්ධනය සඳහා අත්තිවාරමක් සැපයීම සඳහා ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපන ප්‍රවේශය හා ගුණාත්මක බව වැඩි කිරීමයි. මූල්‍ය හා ප්‍රදාන ගිවිසුම්වලට අනුව, රු.මිලියන 13,000 කට සමාන විගැහි මිලියන 64.1 ක (එජඩො මිලියන 100) ණය මුදලක් සැපයීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟ වී තිබුණු අතර ඕස්ට්‍රේලියානු භාර අරමුදල විසින් එජඩො මිලියන 11.13 ක ප්‍රදාන සැපයීමට එකඟ වී තිබුණි. 2016 ජූනි 28 දින ව්‍යාපෘති ගිවිසුමට කරන ලද සංශෝධනය අනුව, ප්‍රදාන මුදල රු.මිලියන 5,845කට සමාන එජඩො මිලියන 39.11ක් දක්වා වැඩිකර තිබුණි. එම ණය මුදලින් සියයට 70 ක් පළාත් අධ්‍යාපන අධිකාරීන් සඳහා වෙන්කර තිබුණු අතර ඉතිරි සියයට 30 අධ්‍යාපන අමාත්‍යාංශය සඳහා වෙන්කර තිබුණි. ව්‍යාපෘතියේ කාර්යයන් 2012 ඔක්තෝබර් 01 දින ආරම්භ කරන ලද අතර 2017 ජූනි 30 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. ප්‍රදාන යටතේ සිදුකළ යුතු කාර්යයන් 2016 අප්‍රේල් 30 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

පළාත් සභා නවයෙහි ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන

ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාවේ දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාවේ ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාවේ සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද ප්‍රගති වාර්තා සහ වැඩි දියුණු කරන ලද මූල්‍ය වාර්තා ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාවේ දැක්වෙන වියදම් සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ අරමුදල් සහ ප්‍රදාන සපයනු ලබන නියෝජිතායතනයන්ගෙන් ලද අරමුදල් වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් වලින් උද්ගත වූ වත්කම් හා වගකීම්, ණය හා ප්‍රදාන වලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව.

(ඈ) ණය හා ප්‍රදාන යටතේ ආපසු ගැනීම් ණය හා ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේ ද යන බව.

(ඉ) ණය හා ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේ ද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනා ගෙන තිබුණේ ද යන බව.

(උ) මුදල් රෙගුලාසි 150 සහ අදාළ පළාත් සභා ප්‍රධාන ලේකම්වරු විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ උපදෙස් වලට අනුකූලව ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව පිළියෙල කර තිබුණේ ද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේ ද යන බව, සහ

(එ) ණය හා ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේ ද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය

------

මගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මාගේ මතය වනුයේ,

(අ) විගණනය සඳහා ඉදිරිපත් කරන ලද පළාත් සභා නවයෙහි පළාත් අධ්‍යාපන අමාත්‍යාංශවල 2017 වර්ෂයේ විසර්ජන ගිණුම් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 150 සහ අදාළ පළාත් සභා ප්‍රධාන ලේකම්වරු විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ උපදෙස් වල සඳහන් විධිවිධානවලට අනුකූල වන පරිදි පිළියෙල කර ඉදිරිපත් කර ඇත. ඉහත විසර්ජන ගිණුම් භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන්, වාර්ෂික අයවැය ඇස්තමේන්තු හා පළාත් සභා නවය විසින් පවත්වා ගෙන යනු ලැබූ පොත්පත්, ලේඛන හා වාර්තා සමඟ එකඟ වේ. 2017 වර්ෂය සඳහා ණය සහ ප්‍රදාන මුදල් වලින් දරන ලද පිරිවැය පළාත් සභා නවයෙහි විසර්ජන ගිණුම්වල සහ මෙහෙයුම් හා නියාමන සහාය ඒකකයේ නියමිත පරිදි වාර්තා කර තිබුණු බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේ ද යන බව.

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඈ) ණය හා ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

------------------------------------

### 3.1 අරමුදල් උපයෝජනය

-------------------------

ව්‍යාපෘතියේ ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව අනුව සියලුම පළාත් සභාවල පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ හා මෙහෙයුම් හා නියාමන සහාය ඒකකය විසින් සියලු මූලාශ්‍රවලින් ලද අරමුදල් වලින් දරන ලද මුළු පිරිවැය රු.මිලියන 133,121.51 ක් විය. අධ්‍යාපන ක්ෂේත්‍රයේ අයවැය ඇස්තමේන්තුවලට සහාය වීම සඳහා ජාත්‍යන්තර සංවර්ධන සංගමයෙන් හා ඕස්ට්‍රේලියානු භාර අරමුදලෙන් ලැබුණු අරමුදල් මූල්‍යයනය, සමාලෝචිත වර්ෂයේ අයවැයගත වෙන්කිරීම් සහ සමාලෝචිත වර්ෂය තුල හා 2017 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනයට අදාල වැදගත් සංඛ්‍යාලේඛන පහත දැක්වේ.

| ප්‍රභවය | මූල්‍ය හා ප්‍රදාන ගිවිසුමට අනුව මූල්‍යයනය කිරීමට එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම් | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2017 වර්ෂය තුල | | 2017 දෙසැම්බර් 31 දක්වා | |
| | එජඩො මිලියන | රු. මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන |
| ජාසංස | 100 | 13,000 | 1,650 | 6.90 | 1,056 | 65.99 | 8,992 |
| ඕභාඅ | 39 | 5,845 | 1,080 | 6.50 | 987 | 29.85 | 4,150 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| එකතුව | 139 | 18,845 | 2,730 | 13.40 | 2,043 | 95.84 | 13,142 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මෙහෙයුම් සහ නියාමන සහාය ඒකකයට රු.මිලියන 40 ක වෙන්කිරීමක් ඇතුළුව 2017 අයවැය ඇස්තමේන්තුව මඟින් ව්‍යාපෘති කාර්යයන් ක්‍රියාත්මක කිරීමට රු.මිලියන 2,730 ක් වෙන්කර තිබුණද, 2017 දෙසැම්බර් 31 දිනට එකතුව රු.මිලියන 2,043 ක් පමණක් මහා භාණ්ඩාගාරයෙන් නිදහස් කර තිබුණි.

(ආ) දකුණු පළාත සඳහා වෙන්කරන ලද රු.මිලියන 280 ක මුදලින් එකතුව රු.මිලියන 224 ක මුදලක් පමණක් මහා භාණ්ඩාගාරය විසින් නිදහස් කර තිබුණි. කෙසේ වුවද, 2017 දෙසැම්බර් 31 වනවිට රු.මිලියන 140.38 ක මුදලක් උපයෝජනය කර තිබුණි. වියදම් නොකරන ලද රු.මිලියන 73.95 ක මුදල දකුණු පළාත් සභාවේ පවත්වාගෙන යන තැන්පත් ගිණුමක රඳවාගෙන තිබුණි. තවද, 2017 වර්ෂය සඳහා වාර්ෂික ඇස්තමේන්තුව අනුව, ඌව පළාත සඳහා කරන ලද රු. මිලියන 320 ක වෙන්කිරීමෙන් එකතුව රු. මිලියන 257 ක් පමණක් මහා භාණ්ඩාගාරයෙන් නිදහස් කර තිබුණි. කෙසේවෙතත් ලැබුණු රු. මිලියන 121.26 ක මුදලක් පමණක් උපයෝජනය කර තිබුණි. වියදම් නොකරන ලද රු. මිලියන 103.42 ක මුදල පළාත් සභාව විසින් පවත්වාගෙන යන තැන්පත් ගිණුමක රඳවාගෙන තිබුණි.

(ඇ) 2017 දෙසැම්බර් 31 දක්වා පෙර වර්ෂ 6 ක කාලපරිච්ඡේදය සඳහා අයවැය ඇස්තමේන්තුවලට අනුව, එකතුව රු.මිලියන 2,013.07 ක් ඒ සඳහා වෙන්කර තිබුණද, මධ්‍යම පළාත් සභාව අධ්‍යාපන ක්ෂේත්‍ර සංවර්ධන කාර්යය රාමුවක් සහ වැඩ සටහන යටතේ කටයුතු ක්‍රියාත්මක කිරීමේ අරමුණු සඳහා එකතුව රු.මිලියන 1,270.81 ක් පමණක් උපයෝජනය කර තිබුණි. මධ්‍යම පළාතේ පළාත් අධ්‍යාපන අරමුණු සඳහා වෙන්කළ මුදල් අපේක්ෂිත අරමුණු සඳහා කාර්යක්ෂමව උපයෝජනය කර නොගන්නා බව එයින් පෙන්වා දෙනු ලැබේ.

**3.2 භෞතික ප්‍රගතිය**

--------------------

ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුමේ උපලේඛන 01 අනුව, ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනයට ප්‍රවේශවීම ප්‍රවර්ධනය, අධ්‍යාපන ගුණාත්මක බව ඉහල නැංවීම හා පාලනය හා අධ්‍යාපන සේවා සැපයීම සවිබල ගැන්වීම යන ප්‍රධාන අරමුණු 03 යටතේ මුදල් වියපැහැදම් කිරීම් සම්බන්ධ දර්ශක සාක්ෂාත් කර ගැනීමට බලාපොරොත්තු විය. පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2018 ජුනි 20 අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2017 පාසල් සංගණන වාර්තාවේ සපයන ලද තොරතුරු අනුව, දිවයිනේ පාසල් පද්ධතිය රජයේ පාසල් 10,194 කින් සමන්විත වන අතර එයින් ශිෂ්‍යයින් 200 ට වඩා අඩු පාසල් 5,161 පවතින අතර මධ්‍යම පළාතේ එවැනි පාසල් 812 ඇතුළත් වේ. තවද, බස්නාහිර පළාතේ පාසල් 79 ක් ඇතුළත්ව ශිෂ්‍යයින් 2,500 වඩා වැඩි පාසල් 206 ක් පවතී. දිවයිනේ නාගරික ප්‍රදේශවල ජනප්‍රිය පාසල් තුළ ශිෂ්‍යයින් ගහනය ව්‍යාප්ත වී පවතින බව එයින් දැක්වේ.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට පාසල් 442 ක් සඳහා විදුහල්පතිවරු වෙන්කර නොතිබුණු අතර පළාතේ අධ්‍යාපන කලාප 10 ක අනෙකුත් පාසල් වල විදුහල්පතිවරු 124 දෙනෙකු අතිරික්තව පැවතුණු බව ඌව පළාතේ පාසල් විදුහල්පතිවරු වෙන්කිරීම පිළිබඳව සිදුකරන ලද විගණන පරීක්ෂාවේදී අනාවරණය විය. සාධාරණ ක්‍රමයකට පාසල් විදුහල්පතිවරු වෙන්කිරීමට ඌව පළාත් සභාව විසින් වැඩපිළිවෙලක් යොදාගෙන නොතිබුණු බව එයින් දැක්වේ.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

**-----------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රු.මිලියන 868 ක ඇස්තමේන්තුගත පිරිවැයක් වූ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන ලද දින සිට වර්ෂයක් ඉකුත් වී ඇතත්, මධ්‍යම පළාතේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ පළාත් පාසල් ගුරුවරුන්ගේ නේවාසිකාගාර සහ පාසල් දත්ත සායන මධ්‍යස්ථානය අළුත්වැඩියා කිරීමේ කාර්යයන් සහ පානීය ජලය සහ සනීපාරක්ෂක පහසුකම් සැපයීමේ කාර්යයන් 2017 දෙසැම්බර් 31 දිනට අවසන් කර නොතිබුණි.

(ආ) උතුරු මැද පළාතේ පදවියේ මහසෙන් ප්‍රාථමික පාසල, රබෑව **තම්බල්ගොල්ලෑව** ප්‍රාථමික පාසල, තමන්කඩුව සිංහපුර ප්‍රාථමික පාසල, වැලිකන්ද කලහගල ප්‍රාථමික පාසල සහ නුරනිය ප්‍රාථමික පාසල සහ ගිරිතලේ ජනාධිපති විද්‍යාලය යන පාසල්වල සිදුකරන ලද ස්ථානීය පරික්ෂාවේදී ඉදිකරන ලද ගොඩනැඟිලිවල දෝෂ පවතින බව නිරීක්ෂණය වී තිබුණි. ඉදිකිරීම් කාර්යයන් පිළිබඳව විධිමත් සුපරීක්ෂණයක් සඳහා පළාත් සභා විසින් ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණු බව එයින් දැක්වේ.

**3.4 අක්‍රීය සහ ඌන උපයෝජිත වත්කම්**

----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 ජූලි රු.මිලියන 6.11 ක පිරිවැයකට මිලදීගත් විද්‍යාගාර උපකරණ මධ්‍යම පළාතේ පළාත් පාසල් සඳහා 2018 මාර්තු 23 දින වන විටත් බෙදාහැර නොතිබුණු බව ස්ථානීය පරික්ෂාවේදී අනාවරණය වී තිබුණි.

(ආ) උපකරණවල අඩු ගුණාත්මකභාවය හේතුවෙන්, සබරගමු පළාතේ පළාත් පාසල් 14 ක භාවිතය සඳහා සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 13.07 පිරිවැයකට මිලදීගත් විද්‍යා උපකරණ පාසල් පරිශ්‍රවල භාවිතා කිරීමෙන් තොරව පවතී. තවද, ගුරුවරුන් සහ විද්‍යාගාර යනාදී හිඟකම හේතුවෙන්, රු.මිලියන 5.27 පිරිවැයකට මිලදීගත් විද්‍යා හා ගණිත උපකරණ සබරගමුව පළාතේ පළාත් පාසල් 08 ක අක්‍රීයව පවතී.

(ඇ) 2018 ජුනි 30 දින වන විටත් බිම ටයිල් කිරීමේ වැඩ සහ වහලේ වැඩ අවසන් නොවීම හේතුවෙන්, ඌව පළාතේ දඹාන ප්‍රාථමික පාසලේ රු.මිලියන 2.82 ක පිරිවැයකට අළුතින් ඉදිකරන ලද සාමාන්‍ය පෙළ විද්‍යාගාර ගොඩනැගිල්ල 2017 ජනවාරි 06 භාරදුන් දින සිට භාවිතා නොකර පවතින බව නිරීක්ෂණය විය. තවද, කියවීම සඳහා අවශ්‍ය පොත්පත් හිඟකම හේතුවෙන්, ඌව පළාතේ කිවුල්ගෙදර ප්‍රාථමික පාසලේ ඉදිකරන ලද පුස්තකාල ගොඩනැඟිල්ල අපේක්ෂිත අරමුණු සඳහා යොදා ගෙන නොතිබුණි. ඉහත සඳහන් පාසලේ පුස්තකාලයක් සඳහා ගොඩනැඟිල්ලක් ඉදිකිරීම වෙනුවට විද්‍යාගාරයක් සඳහා ප්‍රමාණවත් පහසුකම් සැපයීමේ ප්‍රමුඛ අවශ්‍යතාවය ව්‍යාපෘතිය හඳුනාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.